සමාජයේ සිටින යම් යම් කොටස් සම්බන්ධයෙන් මාධ්‍ය සිදුකරන ඇතැම් සෘණාත්මක ලේබල්කරණයන් ඔස්සේ සිදුවිය හැකි හානිය සම්බන්ධයෙන්, Ethics Eye අපි මීට පෙරද පෙන්වා දී ඇත්තෙමු. උදාහරණ ලෙසට, "කුඩ්ඩා", "මත්ලෝලියා" වැනි ලේබල් ඔස්සේ, ඔවුන්ව සමාජය තුළ වඩ වඩාත් කොන් වීමත්, පුනරුත්ථාපනයෙන් පසුව හෝ නැවත සමාජයට එක් වීමට බාධා පැමිණීමත් සිදුවිය හැකි වේ.

එසේ නම්,

1) මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු සංකීර්ණ කරුණු සමුදායක් හේතු කොට ගෙන සිදුවන, සුව කළ හැකි තත්වයක් මිස, හුදු මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමක් නොවන හෙයින්, 'මත්ලෝලියා' වැනි යෙදුමක් ඔස්සේ පිළිබඳවද වැරදි අදහසක් සමාජගත නොවන්නේ ද?

2) "කුඩ්ඩා" යන යෙදුම හා බැඳී ඇති ගර්හාත්මක සහ නිෂේධනාත්මක අර්ථය සමඟින්, ඔවුන්ට සමාජයෙන් එල්ල වන කොන් කිරීම වඩාත් තීව්‍ර නොවන්නේ ද?

3) "කුඩ්ඩා" හෝ "මත්ලෝලියා" වැනි යෙදුම් වෙනුවට, "මතට ඇබ්බැහි වූවන්", "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය වෙතැයි ඔබ නොසිතන්නේ ද?

ධනාත්මක සමාජයක් වෙනුවෙන් සෘණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!